# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2164/70 - 2020 පෙබරවාරි මස 28 වැනි සිකුරාදා - 2020.02.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 1/2005

**2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත**

2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 6, 9, 17, 18 සහ 25 වන වගන්ති සමග කියවිය යුතු, එකී පනතේ 204 වන වගන්තිය යටතේ උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍ය.

2020 පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2019 ජූනි මස 17 වන දිනැති අංක 2128/6 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2019 අංක 01 දරන බුද්ධිමය දේපළ නියෝග (ගීත සහ සංගීතමය කෘති), එහි 2(1) වන නියෝගයේ "ලිඛිත ගිවිසුමකට එළඹිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"ලිඛිත ගිවිසුමකට එළඹිය යුතු ය:

එසේ වුව ද, යම් ගී පද රචකයකු, සංගීතඥයෙකු හෝ ගායකයෙකුට ගෙවනු ලැබිය යුතු අවම කර්තෘභාගය -

(අ) ගීතයක් හෝ සංගීතමය කෘතියක් හෝ පදමාලාවක් හෝ එවැන්නක සැළකිය යුතු කොටසක් සම්බන්ධයෙන් වන විට, එම ගීතය හෝ සංගීතමය කෘතිය හෝ පදමාලාව හෝ එවැන්නක සැළකිය යුතු කොටසක් ගුවන් විදුලිය ඔස්සේ එක් වරක් විකාශය කිරීම සඳහා රුපියල් විස්සක (20/-) මුදල් ප්‍රමාණයක් ; සහ

(ආ) ගීතයක් හෝ සංගීතමය කෘතියක් හෝ පදමාලාවක් හෝ එවැන්නක සැළකිය යුතු කොටසක් සම්බන්ධයෙන් වන විට, එම ගීතය හෝ සංගීතමය කෘතිය හෝ පදමාලාව හෝ එවැන්නක සැළකිය යුතු කොටසක් රූපවාහිනිය ඔස්සේ එක් වරක් විකාශය කිරීම සඳහා රුපියල් සියයක (100/-) මුදල් ප්‍රමාණයක්,

විය යුතු ය.".


1A - G 31974 — 30 (2020/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*